# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## සවිස්තරාත්මක අධ්‍යයන වාර්තා
## ලබාගැනීම හා උපාධි ප්‍රදානෝත්සවය සඳහා අයදුම් කිරීම

ව්‍යාපාර කළමනාකරණවේදි උපාධි තෙවන පරීක්ෂණයට අදාලව 2024 අගෝස්තු මස 09 දින නිකුත් කරන ලද උපාධිලාභී නාමලේඛනයෙහි නම් සඳහන් උපාධිලාභීන් හට සවිස්තරාත්මක අධ්‍යයන වාර්තාව (Academic Record) කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතියෙන් පසු 2024 අගෝස්තු මස 23 දින සිට ලබාගත හැක.

ඒ සඳහා දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවියට පිවිස බාගත කරගත් අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර නියමිත මුදල් ගෙවීමෙන් අනතුරුව පහත දැක්වෙන **එක් ක්‍රමයක්** මගින් ලබාගැනීමට හැකියාව පවතී.

01. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත අයදුම්පත හා මුදල් ගෙවන ලද වවුචර්පත මධ්‍යහ්න 12.00 ට පෙර ගෙනැවිත් බාරදීමෙන් එදිනම ලබාගත හැක.
02. අයදුම්පත හා මුදල් ගෙවන ලද වවුචර්පත "**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, තැ.පෙ. 03, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකිරීමෙන් පසු තම පෞද්ගලික ලිපිනයට ගෙන්වා ගත හැක.

එසේම ඉහත උපාධි පාඨමාලාවට අදාළ උපාධිලාභීන් සඳහා නියමිත උපාධි ප්‍රදානෝත්සව අයදුම්පත් **2024.08.23** දින සිට අප වෙබ් අඩවියෙන් **(www.cdce.kln.ac.lk)** බාගත කර ගැනීමේ හැකියාව පවතින අතර එසේ බාගත කරගත් අයදුම්පත් 2024.09.06 දිනට පෙර නියමිත පරිදි සම්පූර්ණ කර ඉහත දක්වා ඇති ලිපිනයට තැපැල් කළ යුතුය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.
2024.08.22